සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** **අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018** **40 S I**

## පෙරදිග සංගීතය I

**කාලය පැය එකයි**

උපදෙස් :
(i). සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii). 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

01. නි රි ග රි ස, නි රි ග, ප රි ස, යන ස්වර ඛණ්ඩය යමන් රාගයට අදාළ ස්වර ඛණ්ඩයක් වීම සඳහා තීව්‍ර විය යුත්තේ,
1. පංචමය යි. 2. නිෂාදය යි. 3. මධ්‍යමය යි. 4. රිෂභය හා ගාන්ධාරය යි.

02. ගායනයක් හෝ වාදනයක් ප්‍රගුණ කරන පුද්ගලයකු මුලින්ම කළ යුතු වන්නේ,
1. ආලාප ගායනය වාදනය කිරීමයි 2. සරල ගීතයක් හෝ ශාස්ත්‍රීය ගීතයක් ගායනය වාදනය කිරීමයි
3. ස්වර අභ්‍යාස ගායනය වාදනය කිරීමයි 4. නිවැරදි ඉරියව්වෙන් ආශ්වාස ප්‍රශ්වාස කිරීමයි.

03. ස,රිරිගුස,රිප,මපධමප,ගු,රිස යනුවෙන් ස්වර විස්තාර වන රාගය තෝරන්න.
1. බිලාවල්. 2. කාෆි. 3. යමන්. 4. භෛරවි.

04. ස්වර වලින් පමණක් ප්‍රබන්ධ වූ ගීත විශේෂය හඳුන්වනු ලබන්නේ,
1. මධ්‍යලය ගීත නමිනි 2. ලක්ෂණ ගීත නමිනි 3. සර්ගම් ගීත නමිනි 4. සරල ශාස්ත්‍රීය ගීත නමිනි

05. දාදරා සහ කෙහෙර්වා තාල දෙකේ මාත්‍රා සංඛ්‍යාවන් එකතු වූ විට ලැබෙන මාත්‍රා ගණනට සමාන තාලය, වන්නේ,
1. ජප් තාලය වේ. 2. ලාවනි තාලය වේ. 3. දිප්චන්දි තාලය වේ. 4. ත්‍රි තාලය වේ.

06. සධ සරිගරිස, ලෙස ස්වර සංගති යෙදෙන රාගය වන්නේ,
1. බිලාවල් රාගය යි. 2. කාෆි රාගය යි. 3. භූපාලි රාගය යි. 4. යමන් රාගය යි.


07. 7,6,5 ලෙස ස්වර යෙදෙන රාග ජාති වන්නේ පිළිවෙළින්,
1. සම්පූර්ණ, ඖඩව, ෂාඩව වේ. 2. ඖඩව, ෂාඩව, සම්පූර්ණ වේ.
3. සම්පූර්ණ, , ෂාඩව, ඖඩව වේ. 4. ෂාඩව, සම්පූර්ණ, ඖඩව වේ.

08. භෛරවි රාගය අයත්වන මේලය නම් කරන්න.
1. කාෆි 2. කල්‍යාණ 3. බිලාවල් 4. භෛරවි

09. කාෆි රාගයට අදාල වන කරුණ තෝරන්න.
1. ෂාඩව ජාතියට අයත්ය. 2. ප්‍රකෘති විකෘති ස්වර දොළහම යෙදේ.
3. විවාදි ලෙස ශුද්ධ නිෂාදය භාවිතා වේ. 4. වාදි ග සංවාදි නි වේ.

10. මග මරි සරිස - | ගප ධනි සනි ධප යන තානාලංකාරය වඩාත් සුදුසු වන්නේ,
1. භෛරවි රාගයට වේ. 2. යමන් රාගයට වේ. 3. භූපාලි රාගයට වේ. 4. බිලාවල් රාගයට වේ.

11.




අමීර් කුෂ්රු සංගීතඥයා නිර්මාණය කළ සංගීත භාණ්ඩයට අදාළ අක්ෂරය වන්නේ,
1. A 2. B 3. C 4. D

12. තත් හයකින් යුත් බටහිර තන්ත්‍රීය  භාණ්ඩයට අදාළ අක්ෂරය තෝරන්න.
1. A 2. B 3. C 4. D

13. G D A E සහ ප ස ප ස ලෙස සුසර කරන පෙර අපර දෙදිග භාවිතා වන සංගීත භාණ්ඩයට හිමි ඉංග්‍රිසි අක්ෂරය,
1. B වේ. 2. A වේ. 3. C වේ. 4. D වේ.

14. අලුවක ආධාරයෙන් හා පික් එකක ආධාරයෙන් හඬ නිපදවන භාණ්ඩ යුගලය තෝරන්න.
1. තබ්ලාව, වයලීනය 2. වයලීනය, සර්පිනාව 3. වයලීනය, ගිටාරය 4. ගිටාරය, මැන්ඩලීනය

15. සිංගල් රීඩ්, ඩබල් රීඩ්, ත්‍රිසෙට් යන නම් වලින් භාවිත වන සංගීත භාණ්ඩයට අදාළ අංකය තෝරන්න.
1. A 2. D 3. C 4. B

16. ප්‍රකෘති ස්වර තුනක් යෙදෙන සම්පූර්ණ ජාති රාගයක් නම් කරන්න.
1. බිලාවල් 2. භෛරවි 3. කාෆි 4. භූපාලි

17. ධාධිං - | - - - - | තතිං - | ධාධාධිං - | මෙම ඨේකාවේ දෙවන විභාගයට අදාළ අවනද්ධාක්ෂර වන්නේ,
1. නධධිං- 2. ධාධාධිං- 3. ධාධිංධිංධා 4. ධාධිං-ධා

18. කල්‍යාණ මේලයෙන් උපදින ශුද්ධ ස්වර යෙදෙන රාගයකි,
1. බිලාවල් 2. යමන් 3. භූපාලි 4. කාෆි

19. පධුපනි | ධුපම- | මපධුනි | සං--- | මධ්‍යම භාවයෙන් ලියා ඇති මෙම ස්වර ප්‍රස්ථාරය, සඩ්ජ භාවයෙන් ලියූ විට ලැබෙන ස්වර කාණ්ඩය වන්නේ,
1. රිගුරිම | ගුරිස- | සරිගුම | ප--- |
2. සරිගුම | ගරිස- | සරිගම | ප-- |
3. ගුමපධ | නිධප- | පධනිධ | ප--- |
4. සරිසගු | ගරිස- | රිමගුරි | ස--- |

20. "බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ" යන ගීතය තබ්ලාවකින් වැයීමේදී සුදුසු තාලය වන්නේ,
1. දාදරා ය. 2. දීප් චන්දි ය. 3. බෙම්ටෝ ය. 4. ත්‍රීතාල් ය.

අංක 21 සිට 22 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ගී පද උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

A - දුප්පත් කමට ගොන් බැඳගෙන දක්කනවා....
B - පෙර කාලේ කරපු අකුසල් පල දීලා....
C- දඩිබිඩි ගගා කරනා වැඩ රටවටියේ....

21. ඉහත A B C ගී පදවලින් දැක්වෙන්නේ,
1. ප්‍රශස්ති ගී පාදයන් ය. 2. බැති ගී පාදයන් ය. 3 මෙහෙගී පාදයන් ය. 4. සමාජ ගී පාදයන් ය.

22. ඉහත ගී පාදයන් ගායනා කරනු ලබන්නේ,
1. සමග්‍රහයෙනි 2. අනාඝාතාත්මකවය 3. ආඝාතාත්මකවය 4. විෂම ග්‍රහයෙනි

23. සමාජීය අවශ්‍යතාවයන් මත ගොඩනැගුන ගී,
1. මෙහෙ ගී වේ. 2. සමාජ ගී වේ. 3. බැති ගී වේ. 4. ප්‍රශස්ති ගී වේ.

24. වන්නම්, ප්‍රශස්ති, හටන් කාව්‍යයන්හි ගීත හඳුන්වනු ලබන්නේ,
1. ගැමි ගී නමිනි. 2. නාට්‍ය ගී නමිනි. 3. සේ ගී නමිනි. 4. සමාජ ගී නමිනි.

25. විදෙස් ආභාෂය ඇසුරින් නිර්මාණය වූ ගීත
1. කපිරිඤ්ඤා ගීත ලෙස හැඳින්විය හැකිය.
2. උදා ගී ලෙස හැඳින්විය හැකිය.
3. ජන ගීත ලෙස හැඳින්විය හැකිය.
4. මිශ්‍ර සරල ගීත ලෙස හැඳින්විය හැකිය.

26. බයිලා නමැති නැටුම් විශේෂයට යොදා ගත් සංගීතය,
1.නූර්ති සංගීතය වේ. 2. නාඩගම් සංගීතය වේ. 3. කපිරිඤ්ඤා සංගීතය වේ. 4. බටහිර සංගීතය වේ.

27. සම්ප්‍රධායික නාඩගම් ගී තනු ආශ්‍රයෙන් නව නාට්‍ය ගීත නිර්මාණය කොට ඇත. "දුල් නිමල් සිසිසේ හා යානත අතුල මල් පෙති" යන පැරණි නාඩගම් ගීත ආශ්‍රයෙන් නිර්මාණය වූ ගීත ලෙස,
1. නන් සිරින් වොරදි හා බුදු තුල් ගුණැති සමිඳුනේ... ගීත හැඳින්විය හැක.
2. ලප නොමවන් සඳ හා උඳුල කර වන ගීත හැඳින්විය හැක.
3. සේ සුරිඳුන් හා දසදෙස ඉන්‍ද්‍රා ගීත හැඳින්විය හැක.
4. ඉර සඳ දෙවියනි හා ප්‍රේමයෙන් මන රංජිත වේ ගීත හැඳින්විය හැක.

28. උරුට්ටුව,තෝඩායම, ඉන්නිසය යන සුවිශේෂ අංග ඇතුළත් නාට්‍ය සම්ප්‍රධාය වන්නේ,
1. නූර්ති ය. 2.නාඩගම් ය. 3. සොකරි ය. 4.කෝලම් ය.

29. ස්ථායි අන්තරා ආකෘතියක් ඇති දොහොරාව නම් සුවිශේෂ අංගයක් ඇති නාට්‍ය සම්ප්‍රදාය තෝරන්න.
1. නාඩගම් 2. කෝලම් 3. නූර්ති ය 4. සොකරි ය

30. පසන්, චාපු, තිර්ලානා, වඩිමුඩි, තංග පාඨ යන තාල වාදනය සඳහා සුදුසුම වාද්‍ය භාණ්ඩය,
1. තබ්ලාව වේ. 2. ගැටබෙරය වේ. 3. මද්දලය වේ. 4. දවුල වේ.

31. බටහිර ඔස්ට්‍රියාවේ සැල්ස්බර්ග් නුවර ක්‍රි.ව.1756 ජනවාරි 27 දා උපන් සංගීතඥයකු වන්නේ,
1. ලුඩ්විග් වෑන් බිතෝවන් 2. වුල්ෆ් ගැන්ග් අමදියෙස් මෝර්සාට් 3. යානි 4. බාර්ක්

32. බෙර පදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව යන කොටස් ඇතුළත් වනුයේ,
1. පහතරට වන්නම් වල ය. 2. උඩරට වන්නම් වල ය.
3. සබරගමු වන්නම් වල ය. 4. සිංදු වන්නම් වල ය.

33. ගැටබෙරය, පහතරට බෙරය, දවුල යන අවනද්ධ භාණ්ඩ පිළිවෙළින්,
1. පහතරට, උඩරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත්ය. 2. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත්ය.
3. සබරගමු, උඩරට, පහතරට සම්ප්‍රදායන්ට අයත්ය. 4. උඩරට, සබරගමු, පහතරට සම්ප්‍රදායන්ට අයත්ය.

34. දයානන්ද ගුණවර්ධන ශූරීන් විසින් රචිත නෛනගේ සුදුව නව නාට්‍යයේ ඇතුළත් ගීතයක් වන්නේ,
1. අපෙ මුණි සඳ එර්දි බලෙන්.... 2. පළමුව මම වැන්ද බුදුන් සිහි කරගෙන ඒ ගුණ කද....
3. අපි කිරිල්ලියෝ.... 4. සුවඳ සබන් ඇග ගාලා හායි හායි....

35. F minor chord එකට අයත් ස්වර වන්නේ,
1. ස් ම ධ 2. ම ධ ස් 3. ම ධ ස් 4. ධ ම ස්

36. ස-රි- | ග--- | ග-රි- | ස--- | මෙම ස්වර ඛාණ්ඩයට Harmony වන ස්වර ඛාණ්ඩය
1. ප-ධ- | නි--- | නි-ධ- | ප--- | 2. සරිග- | ම-ග- | ස--- | ---- |
3. ග--ම | ග--- | ම-ගරි | ස--- | 4. ම-ගරි | ග--- | රි-නිරි | ස--- |

37. සවන් දී පෙර රාම චරිතේ අසව් යන ගීතයට පාදක වූ රාගය වන්නේ,
1. කාෆි 2. භූපාලි 3. බිලාවල් 4.යමන්

38. සිංහල චිත්‍රපට ඉතිහාසයේ ස්වාධීනව තනු නිර්මාණය කළ චිත්‍රපටයකි.
1. රන්මුතු දූව 2. රේඛාව 3. අශෝක මාලා 4. කඩවුණු පොරොන්දුව

39. CD, DVD, Blue Ray යනු,
1. සාහිත්‍ය සමග සබඳතා ඇති උපකරණ වේ. 2. සංගීතය පටිගත කොට ගබඩා කරන ලද උපකරණ වේ.
3. අන්තර්ජාල උපාංග වේ. 4. සංගීත භාණ්ඩ වාදනය සඳහා භාවිත උපකරණ වේ.

40. ලංකාවේ ප්‍රචලිත රංග සම්ප්‍රදායන් අතරින් දේශීය අනන්‍යතාවය පැහැදිලිව පෙන්නුම් කෙරෙන නාට්‍යයක් ලෙස,
1. කෝලම් නාට්‍ය හැඳින්විය හැක. 2. සොකරි නාට්‍ය හැඳින්විය හැක.
3. නාඩගම් නාට්‍ය හැඳින්විය හැක. 4. නූර්ති නාට්‍ය හැඳින්විය හැක.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය — අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 — **40 S II**

**පෙරදිග සංගීතය II** — **කාලය පැය දෙකයි**

උපදෙස් :
* පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. **අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**
   (i) මගමරි සරිස ... යන ස්වර මාලාව අයත් වන රාගය නම් කරන්න.
   (ii) භෛරවී රාගයේ ශුද්ධ රිෂභය ශුද්ධ ගාන්ධාරය තිව්‍ර මධ්‍යමය ශුද්ධ ධෛවතය ශුද්ධ නිශාධය යන ස්වර හැඳින්විය හැක්කේ කිනම් ස්වර ලෙසද?
   (iii) රාගධාරි සංගීතයේ ස්ථායි අන්තරා ආකෘතිය දක්නට ඇති ගායන ශෛලියක් නම් කරන්න.
   (iv) රාගධාරි ගායන වාදන වලදී සමග්‍රහය දක්වා වූ කොටස හඳුන්වන නාමය කුමණ නමකින් හැඳින්වේ ද?

**අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර සපයන්න.**
   (v) පහතරට සින්දු වන්නම් රචනා කළ රචකයා වන්නේ..................................... ය.
   (vi) විෂම ග්‍රහයෙන් ගැයෙන ගීතයක මුල් පාදය ලියා දක්වන්න.
   (vii) පෙර නොවූ විරූ සංගීත භාණ්ඩ විශාල සංඛ්‍යාවක් යොදා ගනිමින් බටහිර සංගීතයේ ප්‍රගමනයට දායක වූ සංගීතඥයා වන්නේ ...................................... ය.
   (viii) වර්ෂ 1947 න් ආරම්භ වුන ලාංකීය චිත්‍රපට කර්මාන්තය හැදි වැඩී පෝෂණය වූයේ ................................ චිත්‍රාගාර තුලය.
   (ix) C minor chord (කෝඩ්) එක සඳහා ................................ ස්වර යෙදෙන අතර G minor chord (කෝඩ්) එක සඳහා ................................ ස්වර භාවිතා වේ.
   (x) නාඩගම් සංගීතය සඳහා .......................... අවනද්ධ භාණ්ඩය ලෙසත් නූර්ති නාට්‍ය සම්ප්‍රදාය සඳහා ................................... අවනද්ධ භාණ්ඩය ලෙස භාවිතා වේ.

(ල. 12 යි)

02. පහත දැක්වෙන්නේ රාගධාරි සංගීතය ආශ්‍රිත අසම්පූර්ණ තොරතුරු වගුවකි. එම වගුව උපයෝගී කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | රාගය | මේලය | අවරෝහණ | සංවාදි | රාග ජාතිය | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|---|---|
| A | i ........... | කල්‍යාන | ii ........... | ධ | iii ........... | iv ........... |
| B | v ........... | vi ........... | ස්නිධපමගරිස | vii ........... | සම්පූර්ණ | viii ........... |
| C | ix ........... | x ........... | xi ........... | ග | xii ........... | ගරිගප,ධනිස් |

   (i) ඉහත වගුවේ හිස්තැන් සඳහා අදාල පිළිතුරු අනු අංක පිළිවෙලට ලියන්න. (ල.½ x 12=6)
   (ii) A හෝ B රාග දෙකෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක් ස්ථායි කොටස නිවැරදි තාල සංකේත සමඟ ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)
   (iii) C රාගයට අදාලව මාත්‍රා 08 කට නොඅඩුව තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල. 02)

03. පහත සඳහන් රාගාශ්‍රිත සරල ගීත උපයෝගී කරගෙන අදාළ පිළිතුරු සපයන්න.
   A කවුරුදෝ අර කවුලුවෙන් .....
   B ආදරේ කියූ කිසිවෙකු ආදරේ නැතේ .....
   C මම නම් ආසයි අහන්න නයනා ....

   (i) ඉහත දැක්වෙන ABC වලට අදාල සරල ගී ඇතුළත් රාග නම් කරන්න. (ල. 03)
   (ii) A හා C රාගවල ආරෝහණ, අවරෝහණ, වාදි සංවාදි, මුඛාංගය, ගායන සමය ලියා දක්වන්න. (ල.½ x 6=3)
   (iii) A හා C රාගයෙන් එක් රාගයකට අදාළව සර්ගම් හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටස නිවැරදි තාල සංකේත සමඟ ප්‍රස්තාර කරන්න. (ල. 04)
   (iv) රාගධාරි ගායන වාදන සඳහා භාවිතා වන තාලයක් නම් කර එම තාලය නිවැරදි ලෙස ප්‍රස්තාර ගත කරන්න. (ල. 02)

04. පාසලේ පවත්වන ලද විවිධ ප්‍රසංගයක අමල්, විමල්, කමල් වන්නම් සම්ප්‍රදායන්ට අදාළව ගායනා ඉදිරිපත් කරන ලදී. එයින් ඒ ඒ ගායනා සඳහා අමල් ගැටබෙරය ද, විමල් පහතරට බෙරය ද, කමල් දවුල ද වාදනය කරන ලදී.

(i) අමල්, විමල්, කමල් වැයූ බෙර වර්ග කුමන වන්නම් සම්ප්‍රදායන්ට අයත් දැයි පිළිවෙළින් ලියන්න. (ල. 03)
(ii) අමල් වැයූ වන්නම් සම්ප්‍රදායට අදාළව කරුණු 03 ක් ලියන්න. (ල. 03)
(iii) විමල් වැයූ වන්නම් සම්ප්‍රදායට අදාළව කරුණු 03 ක් ලියන්න. (ල. 03)
(iv) කමල් වැයූ වන්නම් සම්ප්‍රදායට අදාළව කරුණු 03 ක් ලියන්න. (ල. 03)

05. පහත දැක්වෙනුයේ ඔබ විෂය නිර්දේශයට අයත් අක්‍රමවත් වගුවකි. එම වගුව උපයෝගී කොටගෙන පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | ගී වර්ගය | ගීතය | දායක වූවන් |
|---|---|---|---|
| A | නූර්ති ගී | සිනිඳු සුදු මුදු තලාවේ | වික්ටර් රත්නායක |
| B | චිත්‍රපට ගී | ආදරයේ උල්පත වූ අම්මා | ජයසේකර අපොන්සු |
| C | නව නාට්‍ය ගී | සවන් දී පෙර රාම චරිතේ අසව් | ජෝන් ද සිල්වා |
| D | මව්පිය ගුණ ගී | අපි කිරිල්ලියෝ | සෝමදාස ඇල්විටිගල |

(i) එක් එක් ඉංග්‍රීසි අක්ෂරය යටතේ ගැළපෙන හෝ නිවැරදි තොරතුරු ලියා දක්වන්න. (ල. 04)
(ii) නූර්ති සංගීතයේ සංගීතමය ලක්ෂණ 04 ක් ලියා දක්වන්න. (ල. 04)
(iii) චිත්‍රපට ගී පිළිබඳව කෙටි විස්තරයක් ලියා දක්වන්න. (ල. 04)

06. (i) ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගීත පිළිබඳව විශේෂ කරුණු 03 ක් ලියා දක්වන්න. (ල. 03)
(ii) ග්‍රැමෆෝන් තැටි ගී යුග හඳුන්වා ඒ ඒ යුගවලට අයත් ගීතය බැගින් උදාහරණ සපයන්න. (ල. 06)
(iii) තබ්ලාවේ දායාං බායාං කොටස් දෙකින් තනි තනිව වැයෙන අවනද්ධ අක්ෂර 03 බැගින් ලියා දක්වන්න. (ල. 03)

07. | පප-ප | ප-ධධ | ප--- | සරිගම |
| පප-ම | ග-රි- | ස--- | ස--ස |

(i) ඉහත ස්වර පාද දෙක බටහිර සංගීතය අනුව ප්‍රස්ථාර කරන්න. (ල. 04)
(ii) 𝄞 , 𝅝 , 𝅗𝅥 , $\frac{4}{4}$ යන සංකේත කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)
(iii) භාරතීය තාල පද්ධතියේ දිප්චන්දි, ජප්තාල්, බෙම්ටෝ, දාදරා යන තාල සඳහා බටහිර සංගීතයේ භාවිතා වන Time Signature ලියා දක්වන්න. (ල. 04)